ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අංක: 03/2014

මගේ අංකය: CS/HR/13/II
ඒකාබද්ධ සේවා අංශය,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.


2014.08.20 දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**<u>රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවා ව්‍යවස්ථාවට අනුව දෙවන භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා තවදුරටත් සහන සැලසීම.</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක:1681/29 හා 2010 නොවැම්බර් මස 23 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සංශෝධන අංක: 03 හි සඳහන් 14:3:4 වගන්තියේ (ඇ) උපවගන්තිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවන අතර එම වගන්තිය මගින් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන පන්තියේ නිලධාරීන්ට දෙවන කාර්යක්ෂමතා කඩඉම සඳහා ලබා දී ඇති සහන කාලය 2012.06.30 දින සිට 2013.04.02 දින දක්වා දීර්ඝ කිරීමට, 2014 අගෝස්තු මස 07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

02. ඒ අනුව 2013.04.02 දින දක්වා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන පන්තියේ සියළුම නිලධාරීන්ට දෙවන භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමකින් තොරව ස්වකීය වැටුප් වර්ධක උපයා ගැනීමට සහ නියමිත උසස්වීම් ලබාගැනීමට අවස්ථාව හිමිවේ.



කේ.වී.පී.එම්.ජේ. ගමගේ
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්